# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2011/14 - 2017 මාර්තු මස 22 වැනි බදාදා - 2017.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV(අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

2016 වර්ෂයේ අංක 05 දරන උතුරු පළාතේ, පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු ප්‍රඥප්තිය

උතුරු පළාතේ, පළාත් සභාව විසින් 2016 වර්ෂයේ නොවැම්බර් මස 08 වෙනි දින සම්මත කරන ලද 2016 වර්ෂයේ අංක 05 දරන උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017 වර්ෂයේ මාර්තු මස 16 වෙනි දින අනුමැතිය ලබා දී තිබෙන බව මෙමගින් දැනුවත් කරනු ලැබේ.

**ක. තෙයිවේන්ත්‍රිම්,**
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

2017 මාර්තු මස 17 වැනි දින දී ය.
සභා ලේකම් කාර්යාලය,
ඒ9 මාර්ගය,
කයිතඩි,

**උතුරු පළාත සඳහා පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීමටත්; පරිවාස සහ ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස්වරයා පත් කිරීමටත්; ඒ හා සම්බන්ධ වූ හා ඊට අනුශාංගික වූ කාරණා සඳහා ද වූ විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1944 වසරේ අංක 42 දරන වැරදිකරුවන් පරිවාස කිරීම ආඥපනතේ විධිවිධානවලට අනුකූලව නොවේ.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාව විසින් පහත සඳහන් පරිද්දෙන් නීති පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය 2016 වසරේ අංක 05 දරන උතුරු පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෙම ප්‍රඥප්තිය සඳහා උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලබාදෙනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතුයි.

## I වැනි කොටස

### *පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම*

පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම.

2. (මෙහි මින් මතු ''දෙපාර්තමේන්තුව'' යන්නෙන් සඳහන් කරනු ලබන) උතුරු පළාත් පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යන්නෙන් හඳුන්වනු ලබන දෙපාර්තමේන්තුවක් මෙම ප්‍රඥප්තියේ 5 වැනි වගන්තියෙන් නිශ්චිතව සඳහන් දෙපාර්තමේන්තුවේ පරමාර්ථවලින් පවත්වාගෙන යාමේ අරමුණ පිණිස ස්ථාපිත කළ යුතුය.

පරිවාස සහ ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස්වරයාගේ පත්වීම සහ වෙනත්.

3. (1) (මෙහි මින්මතු ''පළාත් කොමසාරිස්වරයා'' යන්නෙන් සඳහන් කරනු ලබන) පරිවාස සහ ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස්වරයා වශයෙන් සුදුසුකම්ලත් තැනැත්තෙකු පත් කළ යුතු වේ. ඔහු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේය. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන පරිවාස සහ ළමාරක්ෂක සේවා යන විෂය පවරා දී ඇති පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අධීක්ෂණය සහ මාර්ගෝපදේශ යටතේ ක්‍රියාත්මක කළ යුතු ය.

(2) දෙපාර්තමේන්තුවේ පරමාර්ථ ක්‍රියාත්මක කර ගැනීමේ අරමුණට අවශ්‍ය විය හැකි ආකාරයෙන් සේවක සංඛ්‍යාවක් ද, දෙපාර්තමේන්තුවේ මූල්‍ය, පරිපාලන එක් එක් ඒකකවලටම යෝග්‍ය වන්නා වූ පිරිස් බලයක් ද පත්කළ යුතුය.

නියෝග සෑදීම සඳහා අමාත්‍යවරයා සතු බලය.

4. (1) අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියෙන් අන්තර්ගත විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ කවර හෝ කරුණක් සඳහා නියෝග සෑදිය හැකිය.

(2) මෙම වගන්තිය යටතේ සාදනු ලබන එක් එක් නියෝග ගැසට් පත්‍රයෙන් පළ කළ යුතු අතර, එසේ ගැසට් පත්‍රයේ පළ කළ දිනයේ සිට නැතහොත් නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සියළු නියෝග ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට මාස තුනක කාලයක් තුළ උතුරු පළාත් සභාවේ අනුමතය ලබා ගැනීම සඳහා උතුරු පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු වේ. ඉහත දක්වා ඇති පරිදි අනුමත නොකළ කුමන හෝ නියෝගයක් එය අනුමත නොකළ දිනයේ සිට අවලංගු කළ බවට සැළකිය යුතුය. කෙසේ වෙතත්, එකී අවලංගු කිරීම අදාළ නියෝගය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොවන පරිදි විය යුතුය. යම් නියෝගයක් අවලංගු වූවා යැයි සැළකෙන දිනය ගැසට් පත්‍රයෙන් පළ කරනු ලබන දැන්වීමකින් දැනුම් දිය යුතුය.

(4) 1987 වසරේ අංක 42 දරන පළාත් සභා පනතේ IV වැනි කොටසේ විධිවිධාන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ පත්වීම්, ස්ථාන මාරුවීම්, තනතුරින් ඉවත් කිරීම, විනය පාලනය යනාදී සම්බන්ධයෙන් ද අදාළ විය යුතුය.

5. පහත සඳහන් අරමුණු පිණිස වූ ක්‍රියාකාරකම්වලට දෙපාර්තමේන්තුව වගකිව යුතු වන්නේය. දෙපාර්තමේන්තුවේ අරමුණු.

(අ) ළමුන්ගේ නීතිමය රැකවරණය තහවුරු කිරීම;

(ආ) පරිවාස නියෝග සෑදීම සඳහා අධිකරණයට සහාය දැක්වීම;

(ඇ) ළමුන් සඳහා වූ විකල්ප සැළකිලි ක්‍රමවේදයක් ඇති කිරීම සහ පහසුකම් සැළසීම;

(ඈ) ළමා වැරැදිකරුවන්ගේ පුනර්ජීවනය සහ පුනරුත්ථාපනය අදහස් කොට, ඔවුන්ව ආයතනගත කරමින් අධ්‍යාපනය සහ ජීවන වෘත්තීමය පුහුණුව ලබාදීමට කටයුතු කිරීම සහ නැවත සමාජගත කිරීම;

(ඉ) අගතියට පත් ළමුන්ට මානසික සහ සමාජයීය සහාය දැක්වීම;

(ඊ) දරිද්‍රතාවයෙන් හෝ වෙනත් සමාජයීය අවශ්‍යතා හේතුවෙන් ජීවිතය කඩා කප්පල් විය හැකි ළමුන්ගේ සංඛ්‍යාව අඩු කරලීමටත්, වැළැක්වීමටත් පියවර ගැනීම සහ ළමුන් ඉපැයීම වැළැක්වීම;

(උ) ඉතා කාරුණික සහ සීමා කරන ලද නීතිමය පියවරයන් ළමුන් සම්බන්ධයෙන් ගැනීම; සහ

(ඌ) අවශ්‍යතා ඇති ළමුන් කෙරෙහි සැළකිල්ලක් දැක්වීමට කටයුතු කිරීම.

6. දෙපාර්තමේන්තුවේ බලතල, කාර්ය හා කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය– දෙපාර්තමේන්තුවේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

(අ) ළමා අපචාරවලින් අගතියට පත් වූවන්ගේ රැකවරණය වෙනුවෙන් පියවර ගැනීම සහ ළමා අපචාරවලින් අගතියට පත් අනාථ සහ අත්හළ ළමුන් සඳහා සැළකිලි දැක්වීමට සහ ආරක්ෂාව සැපයීමට අධිකරණ නියෝග ලබාගැනීම;

(ආ) අපචාරවලින් ආරක්ෂා කළයුතු ළමයෙකුගේ අයිතිය සහ ළමා අපචාර වළක්වන ක්‍රමයන් පිළිබඳ දැනුවත්වීම් සකස් කිරීම සහ ළමා අපචාර වැළැක්වීම සම්බන්ධිත පර්යේෂණ පැවැත්වීම සහ කටයුතු කිරීම;

(ඇ) අවශ්‍යතා ඇති ළමයෙකුට සැළකිලි සහ රැකවරණ ලබා ගැනීම සඳහා සුදුසු පියවර ගැනීම සහ තම දෙමාපියන්ට කීකරු නොවූ, පාසලට ක්‍රමානුකූල නොවූ, මුරණ්ඩු, සමාජ විරෝධී ක්‍රියාවන්හි නිරත ළමුන්ව සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(ඈ) ළමා අපචාර පාලනය කිරීමට පළාත්, දිස්ත්‍රික්ක හෝ ප්‍රදේශ වශයෙන් වූ කමිටු සහ එහි උප කමිටු ස්ථාපිත කිරීම;

(ඉ) ළමා අපචාර සම්බන්ධයෙන් වූ පැමිණිලි පොදු ජනයාගෙන් සිට ලබාගැනීමත්, අවශ්‍ය වන විටෙක සුදුසු බලධාරීන්ට පැමිණිලි ඉදිරිපත් කිරීම සහ කටයුතු කිරීම;

(ඊ) අවශ්‍යතා ඇති ළමුන්ට හදිසි සහ වෙනත් උපකාර සැපයීම සහ ළමාරක්ෂක සේවා සපයනු ලබන ආයතනයේ අවශ්‍යතාවය පතන ළමුන්ව අනුමත කිරීම;

(උ) ආයතනගත ළමුන්ව, ඔවුන්ගේ පවුල් සමග නැවත සම්බන්ධ කිරීමට පහසුකම් සහ සහාය ලබාදීම;

(ඌ) දරුකමට හදා ගැනීමේ පහසුකම් සහ සහාය ලබාදීම්;

(එ) ඉහළ මට්ටමේ නෛතික වෘත්තිකයාගේ සහ ඉහළ මට්ටමේ නීතිමය නොවන වෘත්තිකයාගේ සේවාවන් ලබාගැනීම;

(ඒ) වරදකරුවෙකු ලෙස සැක කරනු ලැබූ හෝ සැළකිල්ලක් හෝ ආරක්ෂාවක් අවශ්‍යව ඇති ළමයෙකු කෙරෙහි –

(i) සුදුසු තත්ත්වයක් මත නඩු කටයුතු ස්ථාන මාරු කිරීමට අධිකරණය වෙත කරුණු වාර්තා ගත කිරීම ;

(ii) යම් හදාවඩා ගැනීමක් සම්බන්ධයෙන් යෝග්‍යතා නිර්දේශ කිරීම ;

(iii) සැළකිල්ලක් හෝ ආරක්ෂාවක් අවශ්‍ය වන යම් කාර්යයක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම ;

(iv) සම්මුඛ සාකච්ඡා විමර්ශන සහ විභාග කිරීම් යනාදිය පැවැත්වීම ;

(v) අධිකරණය වෙත අතුරු සමාජ වාර්තාවක් සහ අවසන් සමාජ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීම ;

(vi) ආයතන විෂය සමුළුවක් සහ සමාජයීය පදනමේ විෂය සමුළුවක් කැඳවීම ;

(vii) පරිවාස, ළමාරක්ෂක නිලධාරියාගේ අධීක්ෂණය යටතේ ළමුන්ව භාර ගැනීම ;

(viii) ළමයෙකුට එරෙහිව චෝදනා කරනු ලැබූ වැරැද්දට එකඟ වන්නා වූ කරුණු හඳුනා ගැනීමට සහ විසඳාලීමට උත්සාහය දැරීම ;

(ix) දෙපාර්තමේන්තුවට හෝ පරිවාස ළමාරක්ෂක අංශයට පැමිණෙන ළමයෙකුගේ යහපත පිණිස ආහාර, ජලය සහ වැසිකිළි සහිතව මූලික අවශ්‍යතාවලට සම්පත් සැපයීම සහ කටයුතු සැළසීම;

(x) වරදකරුවෙකු ලෙස සැක කරනු ලැබූ හෝ සැළකිල්ලක් හෝ ආරක්ෂාවක් අවශ්‍යව ඇති සෑම ළමයෙකුට ම, ඔවුන් පදිංචි ආයතනයේ සිට අධිකරණය වෙතටත්, අධිකරණයේ සිට එම ආයතනය වෙතටත් ප්‍රවාහන පහසුකම් ලබාදීම.

(ඔ) ළමාරක්ෂක සේවා සපයනු ලබන ආයතනවලට බලපත්‍ර හෝ සහතික නිකුත් කිරීම ; යම් සේවයකට අනුමැතිය ලබාදීම ; ඒ සමග එම ආයතන පරීක්ෂා කිරීම සහ අධීක්ෂණ කිරීම ;

(ඕ) ළමාරක්ෂක සේවා සපයනු ලබන ආයතනවලින් සපයනු ලබන සේවාවන් පිණිස යම් ගාස්තුවක් අයකිරීම හෝ බද්දක් පැනවීම ;

(ක) 1944 වසරේ අංක 42 දරන වැරැදිකරුවන් පරිවාස කිරීම ආඥාපනතට අනුකූලව, අධිකරණය විසින් කරනු ලබන පරිවාස, ළමාරක්ෂක නියෝග අනුගමනය කරමින් කවර හෝ වරදකරුවෙකුගේ අධීක්ෂණය භාර ගැනීම සහ නියෝග අන්තර්ගත කොන්දේසි මුළුමනින්, අනිවාර්යයෙන් අනුගමනය කරන්නේ ද යන්න අවධානය කිරීම ;

(ග) පරිවාස කිරීම පනතේ නිශ්චිත දක්වා ඇති පරිද්දෙන් හෝ නිලධාරියා සුදුසු යැයි අදහස් කරන ආකාරයෙන්, එයට අනුකූලව එම කාල පරතරය තුළ කවර හෝ වරදකරුවෙකු දැකීම සහ ඔහුගෙන් වාර්තාවක් ලබා ගැනීම ;

(ච) කවර හෝ වරදකරුවෙකුගේ පරිවාස සහ දියුණුව කෙරෙහි කාලීන වාර්තා සැකසීම ;

(ජ) අධීක්ෂණය යටතේ වූ වරදකරුවෙකුට අවවාද කිරීම, සහාය දැක්වීම සහ මිත්‍රත්වයෙන් කටයුතු කිරීම, ඒ සමග අවශ්‍ය වන විටෙක, ඔහුට රැකියාවක් සහ නවාතැනක් ලබාදීමට උත්සාහය දැරීම ;

(ට) කවර හෝ වරදකරුවෙකුගේ චරිතය, පූර්වාංග විනය, පරිසරය සහ මානසික හෝ ශාරීරික තත්ත්වය යනාදි සම්බන්ධයෙන් අධිකරණය වෙත සියළු තොරතුරු ඉදිරිපත් කිරීම ;

(ඩ) පරිවාස, ළමාරක්ෂක නඩුවේ අවස්ථානුගත පරිදි පරිවාස, ළමාරක්ෂක නිලධාරියා විසින් කවර හෝ වරදකරුවෙකුගේ අධීක්ෂණය භාර ගැනීමට හැක්කේ ද, යන ප්‍රශ්නය සම්බන්ධයෙන් අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කිරීම ;

(ණ) දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පරිපාලනය සඳහා අත්‍යවශ්‍ය රීතින් සකස් කිරීම ; සහ

(ත) දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා පොදුවේ අවශ්‍ය වන්නා වූ සුදුසු වෙනත් සියළු කාර්යයන් සිදු කිරීම.

## II වැනි කොටස

### *මූල්‍ය*

7. දෙපාර්තමේන්තුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුව විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියළු මුදල් දෙපාර්තමේන්තුවට අනුමත කරනු ලැබූ අරමුදලින් ගෙවීම් කළ යුතුය.

8. මුදල් වර්ෂය එක් කැලැන්ඩරයක වර්ෂය විය යුතුය. *මුදල් වර්ෂය ගිණුම් විගණනය.*

9. (1) දෙපාර්තමේන්තුවට අදළ වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන් ද, ආදයම් සහ වියදම් සම්බන්ධයෙන් ද, වෙනත් සියළු ගනුදෙනු සම්බන්ධයෙන් ද නිසි ගිණුම් පොත් විධිමත් පරිද්දෙන් පවත්වාගෙන යා යුතු ය.

(2) විගණනය කිරීම සම්බන්ධයෙන්, 1987 වසරේ අංක 42 දරන පළාත් සභා පනතේ 23(1), 23(2) යන වගන්ති අදළ වන අතර පරිවාස සහ ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව විගණකාධිපති විසින් හෝ විගණකාධිපති විසින් පත් කරන ලද සුදුසුකම් ලත් විගණනවරයකු විසින් වාර්ෂික විගණනය සිදු කළ යුතුය.

10. යම් තැනැත්තෙකු විසින් මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් කොමසාරිස්වරයාගේ විධානය මත කරනු ලැබූ හෝ කරනු ලදයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් වෙත ඒ තැනැත්තාට විරුද්ධව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා සද්භාවයෙන් කරනු ලැබුවේ යැයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඔහු විසින් දරන ලද යම් වියදමක් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගතහොත් මිස, උතුරු පළාතේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය. *දෙපාර්තමේන්තුව විසින් යම් පුද්ගලයෙකුගේ වියදම් ගෙවීම.*

## III වැනි කොටස

### *සාමාන්‍ය විධිවිධාන*

11. පළාත් කොමසාරිස්වරයා විසින් තමාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය වලින් යම් කිසිවක් දෙපාර්තමේන්තුවේ සුදුසු කාර්ය මණ්ඩලයට පැවරිය හැකිය. *බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම.*

12. (1) දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ආයතන ලියාපදිංචි කොට, අධීක්ෂණය කිරීම කළයුතු වන්නේය. *සටහන් කිරීම, ආයතන ලියාපදිංචි කිරීම.*

(අ) 1979 වසරේ අංක 15 දරන දණ්ඩ නීති සංග්‍රහයේ 452 වැනි වගන්තිය යටතේ ස්ථාපිත අනුමතික නිවාස;

(ආ) ළමා සහ යෞවන පුද්ගල ආඥාපනතේ 48 වැනි වගන්තිය යටතේ ස්ථාපිත රක්ෂිත බන්ධනාගාර නිවාස;

(ඇ) ළමා සහ යෞවන පුද්ගල ආඥාපනතේ 50 වැනි වගන්තිය යටතේ ස්ථාපිත අනුමතික පාසල්;

(ඈ) ළමා සහ යෞවන පුද්ගල ආඥාපනතේ 51 වැනි වගන්තිය යටතේ ස්ථාපිත පුනරුත්ථාපන පාසල්;

(ඉ) අනාථ නිවාස ආඥපනතේ 7 වැනි වගන්තිය යටතේ ස්ථාපිත අනාථ නිවාස;

(ඊ) අනාථ නිවාස ආඥපනතේ 14 වැනි වගන්තිය යටතේ ස්ථාපිත ළමා නිවාස;

(උ) ළමාරක්ෂක නිවාස;

(ඌ) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන;

(එ) රජයේ භාර ගැනීමේ නිවාස;

(ඒ) ළමා සංවර්ධන මධ්‍යස්ථාන;

(ඔ) නේවාසික නිවාස සහ ශිෂ්‍ය නිවාස; සහ

(ඕ) ළමාරක්ෂක සේවා සපයනු ලබන කිසියම් ආයතන;

(2) පළාත් කොමසාරිස්වරයා විසින් සුදුසු යැයි අදහස් කරන යුක්ති සහගත ඕනෑම වේලාවක දී (1) වැනි උප වගන්තියේ සඳහන් කිසියම් ආයතනයකින් තොරතුරු රැස් කළ හැකි වන්නේය.

(3) පළාත් කොමසාරිස්වරයා විසින් ඉල්ලනු ලබන තොරතුරු කලින් කලට ලබාදීම එම ආයතනයේ කර්තව්‍ය වේ.

පවත්වා ගැනීම්.

13. මෙමගින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කරනු ලැබේ–

(අ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්විත දිනයට පෙර දින උතුරු පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත පවරන ලද සියළු චංචල සහ නිශ්චල දේපල, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට උපයෝගිතා පිණිස දෙපාර්තමේන්තුවට අයිති විය යුතුය;

(ආ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාන්විත දිනයට පෙර දින උතුරු පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් හෝ එම දෙපාර්තමේන්තු සමග සිදු කරනු ලද්ද වූත්, තිබෙන්නා වූත් සියළු ගිවිසුම් සහ එකඟතාවයන්, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට කටයුතු කරලීම පිණිස දෙපාර්තමේන්තුව විසින් හෝ ඒ සමගින් කරගන්නා ලද ගිවිසුම් සහ එකඟතාවයන් ලෙස සැළකිය යුතුය;

(ඇ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාන්විත දිනයට පෙර දින උතුරු පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් හෝ එම දෙපාර්තමේන්තුවට විරුද්ධවව ගොනු කරන ලද්ද වූත්, අවසන් නොකරන ලද්ද වූත්, සියළු නඩු සහ නඩු පියවරයන්, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට කටයුතු කරලීම පිණිස දෙපාර්තමේන්තුව විසින් හෝ එයට විරුද්ධව පවරන ලද නඩු වශයෙන් සහ නඩු පියවරයන් වශයෙන් සැළකිය යුතුය. ඒ සමගින් එයට අනුකූලව අඛණ්ඩව කටයුතු කිරීමත්, නිමා කිරීමත් සිදු කළ යුතු වන්නේය;

(ඈ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාන්විත දිනයට පෙර දින උතුරු පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව උදෙසා හෝ එම දෙපාර්තමේන්තුවට විරුද්ධව දෙනු ලද්දා වූත් හෝ කරන ලද්දා වූත් සෑහීමකට පත් නොවූ සියළු තීන්දු නියෝග මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට කටයුතු කරලීම පිණිස දෙපාර්තමේන්තුව උදෙසා හෝ එයට විරුද්ධව දෙනු ලැබූ තීන්දු වශයෙන් ද කරනු ලැබූ නියෝග වශයෙන් ද සැළකිය යුතුය. ඒ සමගින් එයට අනුකූලව බලාත්මක විය හැකිය; සහ

මෙම ප්‍රඥප්තිය ක්‍රියාන්විත දිනයට පෙර දින උතුරු පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සියළු වගකීම්, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට උපයෝගිතා පිණිස දෙපාර්තමේන්තුවේ වගකීම් ලෙස සැළකිය යුතුය.

**14.** මෙම ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස:– අර්ථ නිරූපනය.

''අමාත්‍යවරයා'' යන්නෙන්, උතුරු පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා යන්න අදහස් වේ.

''පරිවාස කිරීම පනත'' යන්නෙන්, (24 වැනි පරිච්ඡේදය) වැරදිකරුවන් පරිවාස කිරීම ආඥපනතේ 3 වැනි වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගයක් යන්න අදහස් වේ.

''ලිඛිත නීති'' යන්නෙන්, යම් නීති සහ අනු නීති යන්න අදහස් වන අතර, එයට උතුරු පළාත් සභාව විසින් සාදනු ලබන ප්‍රඥප්ති සහ යම් නීතියක් යටතේ බලය හෝ බලතල සතු යම් මණ්ඩලයක් හෝ තැනැත්තෙකු විසින් සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියම, ප්‍රකාශන, රීති, අනු නීති සහ නියෝග ඇතුළත් වේ.

**15.** මෙම ප්‍රඥප්තියෙහි සිංහල, දෙමළ භාෂා පාඨයන් අතර යම් අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවතීම.

04 - 63

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.